අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය 'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு 'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
Ministry of Education, Higher Education and Vocational Education 'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/09/96/07/1 ඔබේ යොමුව / உமது இல. / Your Ref. දිනය / திகதி / Date 2025.08.15

සියලු ම පළාත් ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම පරිවේණාධිපතිවරුන්,
සියලු ම පාසල්වල විදුහල්පතිවරුන්

<u>ජාතික කියවීම් මාසය, පාසල් පුස්තකාල සතිය හා පාසල් පුස්තකාල දින වැඩසටහන් ක්‍රියාත්මක කිරීම - 2025</u>

සෑම වර්ෂයක ම ඔක්තෝබර් මාසය ජාතික කියවීම් මාසය ලෙස ප්‍රකාශයට පත් කර තිබේ. ඒ අනුව 2025 ඔක්තෝබර් මාසයට යෙදෙන ජාතික කියවීම් මාසයට සමගාමීව පාසල් සිසුන් සඳහා ක්‍රියාත්මක කළ යුතු වැඩසටහන් පිළිබඳව මඟ පෙන්වීමට මෙම උපදෙස් නිකුත් කෙරෙන අතර පාසල් සිසුන්ගේ කියවීම් ප්‍රවර්ධනය කිරීම මෙහි ප්‍රධාන අරමුණ වේ.

01.ජාතික කියවීම් මාසය තුළ වැඩසටහන් පෙළගැස්ම

පොත්පත් ඇතුළු හරවත් කියවීම් ද්‍රව්‍ය තෝරාගෙන කියවීම තුළින් සමබර පෞරුෂයකින් හෙබි සංවේදී දැනුමැති දරු පරපුරක් බිහි කරලීම සඳහා සෑම කෙනෙකුට ම කියවීම යාවජීව පුරුද්දක් බවට පත් කිරීමේ අරමුණින් මෙම වැඩසටහන් පෙළ ගස්වා ඇති අතර ඒවා පාසලට ගැළපෙන ආකාරයට සකස් කර ක්‍රියාත්මක කිරීම පාසලේ විදුහල්පතිගේ වගකීම වේ. මේ සඳහා අරමුදල් රැස් කිරීම හා සිසුන් හෝ දෙමාපියන් වෙත ආර්ථිකමය වශයෙන් පීඩාවක් ඇති කිරීම නොකළ යුතු අතර පාසලේ පවතින හෝ පාසලට ලැබෙන සම්පත් අවශ්‍ය පරිදි යොදා ගනිමින් ක්‍රියාත්මක කළ යුතු ය. එහිදී පහත දැක්වෙන අංශ කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතු වේ.

1.1 පාසල් සිසුන්ගේ කියවීමේ අවශ්‍යතා හඳුනා ගැනීම හා ඒ සඳහා අවශ්‍ය පහසුකම් සපයා දීම.

1. 2 පුස්තකාල පොත් ඇතුළුව පුස්තකාල කියවීම් ද්‍රව්‍ය එකතුව සංවර්ධනය කර ගැනීම හා පුස්තකාල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා විවිධ වැඩසටහන් සංවිධානය කිරීම.

උදා: පොත් සල්පිලක්/ප්‍රදර්ශනයක් පැවැත්වීම, වාර්ෂික පොත් පරිත්‍යාග දිනයක් ක්‍රියාත්මක කිරීම

1.3 පාසලේ සිසුන් අතර පුස්තකාල භාවිතය වැඩිදියුණු කිරීම, ප්‍රචලිත කිරීම සහ සිසුන්ගේ කියවීම් රුචිකත්වය වර්ධනය සඳහා සුදුසු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

උදා-

- කියවීමේ වටිනාකම පිළිබඳ දැනුවත් කිරීම සඳහා දේශන, සාකච්ඡා, විවාද, කථික, ප්‍රශ්න විචාරාත්මක ආදී වැඩසටහන් සංවිධානය කිරීම.
- පාසලේ පුස්තකාල එකතුවට හා එහි අඩංගු තොරතුරුවලට හා කරුණුවලට කාර්යක්ෂමව ප්‍රවේශ වීමේ ක්‍රමවේද පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- සිසුන් පොත් කියවීමට පොළඹවන අන්දමේ පෝස්ටර් , අත්පත්‍රිකා සහ වගන්ති ප්‍රදර්ශනය කිරීම.
- පොත්පත් කියවීමෙන් ජීවිතය ජය ගැනීම (පොත් කියවමු - ලොව ජය ගමු) යන්න තේමා කරගෙන ජීවිතය ජයගත් ශ්‍රේෂ්ඨ පුද්ගලයන්ගේ චරිතාපදාන හා ස්වයං චරිතාපදාන එකතුවක් රැස් කිරීම, ප්‍රදර්ශනය කිරීම හා ඒ පුද්ගලයින් පිළිබඳව සිසුන්ට හඳුන්වා දීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. (පාසල් පුස්තකාල එකතුව ඇසුරෙන් හෝ වෙනත් මූලාශ්‍ර මගින්)
- කියවීමේ හැකියාවන් හා ක්‍රමවේද වැඩිදියුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා විකල්ප කියවීම් ද්‍රව්‍ය හඳුන්වා දීම මගින් තොරතුරු සාක්ෂරතාවය වර්ධනය කිරීම.
  (උදා - චිත්‍රපට කියවීම, ටෙලි නාට්‍ය කියවීම, පරිසරය කියවීම වැනි දේ තුළින් හරවත් විකල්ප කියවීම් ද්‍රව්‍ය හඳුන්වා දීම, පොත් පාදක කරගත් භාෂා ප්‍රවර්ධන වැඩසටහන්)
- ප්‍රදේශයේ පිළිගත්/ප්‍රසිද්ධ ලේඛකයෙකු හෝ කීර්තිමත් සාහිත්‍යධරයෙකු සහභාගී කර ගෙන සාහිත්‍ය විචාර වැඩසටහන් පැවැත්වීම.

- පාසල තුළ කියවීම් කඳවුරු, කියවීම් සමාජ, පාසල් පුස්තකාල සංගමය වැනි දෑ සංවිධානය කර ක්‍රියාත්මක කිරීම.
- පාසල් භූමිය තුළ හා පන්ති කාමර තුළ ජංගම පොත් මල්ලු/පොත් කුඩා, පොත් මුළු නිර්මාණය කිරීම හා පාසලේ කියවීම් සතියක් පැවැත්වීම.
- 2025 වසරේ පාසලේ හොඳම කියවන්නන්, පුස්තකාලය භාවිතය ඇසුරින් තෝරාගෙන ඇගයීමට ලක් කිරීම.

සැ.යු - ජාතික කියවීම් මාසය තුළ ක්‍රියාත්මක කරන වැඩසටහනට අදාළව පාසල් පුස්තකාල සතිය හා පාසල් පුස්තකාල දිනය සංවිධානය කිරීම සිදු කළ යුතු වේ.

## 02.පාසල් පුස්තකාල සතිය හා පාසල් පුස්තකාල දිනය

පාසල් පුස්තකාල සතිය යෙදී ඇත්තේ සෑම වසරක ම ඔක්තෝබර් මාසයේ (කියවීම් මාසයේ) අවසන් සතියේ වන අතර එම සතියේ සඳුදා දිනය පාසල් පුස්තකාල දිනය ලෙස ජාතික වශයෙන් පිළිගෙන ඇත. ඒ අනුව 2025 වසරේ ඔක්තෝබර් 27 සඳුදා සිට ඔක්තෝබර් 31 වැනි සිකුරාදා දක්වා දින 05ක් පාසල් පුස්තකාල සතියට අදාළ වැඩසටහන් සඳහා යොදා ගත යුතු ය.

මෙම සතියට සමගාමීව පුස්තකාල භාවිතය වැඩිදියුණු කිරීම සඳහා වන වැඩසටහන් පාසල් තුළ ක්‍රියාත්මක කිරීම මගින් ඒ පිළිබඳව කතිකාවක් සහ උද්යෝගයක් ඇති කරමින් සිසුන් තුළ ස්වයං ඉගෙනුම් කුසලතා සංවර්ධනය කිරීමත් අරමුණු කෙරේ.

ඒ අනුව පහත දැක්වෙන උපදෙස් ප්‍රකාරව ජාතික කියවීම් මාසය තුළ පාසල් පුස්තකාල සතිය හා පාසල් පුස්තකාල දිනයට අදාළ වැඩසටහන් පාසල තුළ ක්‍රියාත්මක කිරීම විදුහල්පතිගේ වගකීම වේ. එහිදී පාසල් පුස්තකාල කමිටුවේ අධීක්ෂණයෙන් පාසල් පුස්තකාල කේන්ද්‍ර කරගනිමින් මෙම වැඩසටහන් සංවිධානය කළ යුතු ය.

### 2.1. පාසල් පුස්තකාල සතිය හා පාසල් පුස්තකාල දිනය වැඩසටහන් පෙළගැස්ම (ආදර්ශ ආකෘතිය)

ඔබගේ පාසලට ගැළපෙන ලෙස මෙම වැඩසටහන් සංවිධානය කර ගැනීම සුදුසු වේ.

### 2.1.1. 2025.10.27 දිනය (පළමු වැනි දිනය)

- පුස්තකාල සතියට අදාළ තේමාව සමඟ බැනරය පාසල ඉදිරිපිට ප්‍රදර්ශනය කිරීම,
  2025 වර්ෂයේ තේමාව "පොත් කියවමු - ලොව ජය ගමු"

පාසලට ගැලපෙන පරිදි තේමාවට අදාළ ලෝගෝවක් නිර්මාණය කිරීම - උදා:

(බැනරය හා පෝස්ටර් වැනි දෑ ප්‍රදර්ශනයේ දී මෙම ලෝගෝව අන්තර්ගත කළ හැකි ය)

මෙම බැනරය අවම වශයෙන් දිග අඩි 4ක් සහ පළල අඩි 2ක් වන සේ සකස් කර ගැනීමෙන් සිසුන්ගේ විශේෂ අවධානය ලබාගත හැකි වනු ඇත. එසේ වුවද පාසලට යෝග්‍ය ලෙස බැනරයේ ප්‍රමාණය තීරණය කරගැනීමට හැකිය.

බැනරයේ ආදර්ශ ආකෘතිය

| |
|---|
| "පොත් කියවමු - ලොව ජය ගමු" |
| පාසල් පුස්තකාල සතිය (2025 ඔක්තෝබර් 27 සිට 31 දක්වා) |
| ........................................................................................ විද්‍යාලය |

- පාසලේ උදෑසන රැස්වීමේ දී "පුස්තකාල භාවිතයේ වැදගත්කම" පිළිබඳ කථාවක් පැවැත්වීම සහ පුස්තකාල සතිය හා දිනය ආරම්භවන බවට සිසුන් දැනුවත් කිරීම.
- පාසල් පුස්තකාල සතියට (2025 වර්ෂයට) ලබා දී ඇති තේමාවෙන් ("පොත් කියවමු - ලොව ජය ගමු") දේශන,නාට්‍ය, චිත්‍ර හා පෝස්ටර් හෝ වෙනත් නිර්මාණශීලී අංග සහිතව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

2.1.2 2025.10.28 දිනය (දෙවැනි දිනය)

පුස්තකාලය තුළ හා ඒ අවට පිරිසිදු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, පරිසර අලංකරණ කටයුතු සිදු කිරීම

2.1.3 2025.10.29 දිනය (තුන්වැනි දිනය)

පුස්තකාල එකතුව විධිමත් ලෙස සකස් කිරීම (පිළිවෙළින් ඇසිරීම, අබලි පොත්

භාවිතයට සුදුසු ලෙස පිරිසැකසුම් කිරීම ආදී කටයුතු)

2.1.4 2025.10.30 දිනය (සිව්වැනි දිනය)

පුස්තකාල එකතුව සංවර්ධනය සඳහා නව වැඩසටහන් හඳුන්වා දීම.

(උදා- උපන්දින තිළිණ වැඩසටහන, අලුත් අවුරුදු තිළිණ වැඩසටහන්, පොත් පෙරහැර ආදී)

2.1.5 2025.10.31 දිනය (පස්වැනි දිනය)

2025 වසරේ පාසල් පුස්තකාලය පරිශීලනය කළ සිසුන් අතරින් හොඳ ම කියවන්නන් තෝරා ඔවුන් ඇගයීමට ලක් කිරීම, සිසුන් තුළ කියවීම් ප්‍රවර්ධනය කිරීමට හා කියවීමට පෙළඹවීමක් ඇති කිරීමට සුදුසු වැඩසටහනක් ලෙස මෙය ක්‍රියාත්මක කිරීම සුදුසු ය.

ඉහත සඳහන් උපදෙස් අනුව ඔබ පාසලේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් පිළිබඳ වාර්තාවක් සකස් කර එය ගොනුගත කර පුස්තකාලය භාරයේ තබා ගත යුතු අතර අභ්‍යන්තර හා බාහිර අධීක්ෂණවල දී සහ වෙනත් අවශ්‍ය අවස්ථාවන්හි දී ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. ජාතික පාසලක් වේ නම් එම වාර්තාවේ පිටපතක් අධ්‍යාපන අධ්‍යක්ෂ, පාසල් පුස්තකාල සංවර්ධන ශාඛාව, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල යන ලිපිනයට යොමු කළ යුතු වේ.

ඉහත සඳහන් උපදෙස් අනුව කටයුතු කරන මෙන් ඔබ වෙත කාරුණිකව දන්වා සිටින අතර, ඒ මගින් පාසල් සිසුන් පුස්තකාල භාවිතයට හා හරවත් කියවීම් ද්‍රව්‍ය පරිහරණයට පෙළඹවීම සඳහා ඔබ ගන්නා සියලු උත්සාහයන් ඉතා අගය කොට සලකමි.

(මෙම උපදෙස් මාලාව හා ලිපිය www.gov.moe.lk අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ ද පළ කර ඇත.)

නාලක කළුවැව

ලේකම්